**<u>Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම හා සබැඳි නඩුව

**Case no (නඩු අංකය):** PUTTLAM /TAB 107/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 සැප්තැම්බර් මස 04 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** එම්.එම්.කේ කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා, විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා සහ නයෝමි වික්‍රමසේකර විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් වසන්ත පෙරේරා (රජයේ නීතිඥ කල්හාර ගුණවර්ධන මහතාද අධිකරණයේ රැඳී සිටියේය) | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් මුෆිස් හෙවත් අබු දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් හමාස් හෙවත් අබු සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1,2,4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>3 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච් .එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී.<br><br>5 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ නීතිඥ අද්නාන් ෆසාල් මහතා පෙනී සිටින ලදී. | |

| | | |
|---|---|---|
| | 6 වන චූදිත වෙනුවෙන් ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතිඥ නීතිඥ අද්නාත් ෆසාල් මහතා පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාර්ශවය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | - | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

voir dire පරීක්ෂණය මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් ගෆූර් නානා හෙවත් අබු හදීද් ලබා දෙන ලද පාපොච්චාරණය සම්බන්ධයෙන් මෙදිනද පවත්වන ලදී. (දෙමළ භාෂා පරිවර්තකගේ සහය සහිතව සාක්ෂි ලබාදීම සිදු විය. සාක්ෂිකරු ද්‍රවිඩ භාෂාවෙන් සාක්ෂි ලබා දෙන ලදී.)

ඒ අනුව වයස අවුරුදු 59 ක් වූ මොහෙමඩ් ආදම් ලෙබ්බේ හෙවත් මෙම නඩුවේ 3 වන විත්තිකරු (චූදිත) සාක්ෂිකරුවකු ලෙස සාක්ෂි ලබා දෙන ලදී. මොහු පෙර දිනදීද සාක්ෂි ලබා දී ඇත. ප්‍රථමයෙන් 3 වන විත්තිකරුගේ නීතිඥ මහතා මූලික ප්‍රශ්න විමසීම සිදු කරන ලදී.

3වන චූදිත CID (Criminal Investigation Department) භාරයේ සිටින විට රෝහලට පසීර් යන CID නිලධාරියා ගෙන ගොස් ඇති බවත්, CID භාරයේ සිටියදී සිංහල භාෂාව ඉගෙනීමට 3වන චූදිත උත්සහ ගෙන ඇති බවත්, CID යට යන විට සිංහල දන්නෙම නැතිව සිටි 3වන චූදිතට එලෙස සිංහල භාෂාව ඉගෙන ගැනීමට වුවමනා වූයේ පෞද්ගලික අවශ්‍යතා (වතුර බොන්න,වැසිකිලියට යාම ආදියට) ඉෂ්ඨ කරගැනීම සඳහා සිංහල භාෂාව වුවමනා වූ බැවින් බවත්, 3වන චූදිත සමඟ සිර කුටියේ (Cell) සිටි සිංහල දෙමළ භාෂා දත් අයගෙන් සිංහල ඉගෙන ගැනීමට උත්සහ ගත් බවත්, එම කාලයේ කොරෝනා තිබූ නිසා වෛද්‍යවරයාට 3වන චූදිතව පෞද්ගලිකව ස්පර්ශ කර පරීක්ෂා කිරීමට හැකියාවක් නොතිබූ බවටත්, ස්පර්ශ කර 3වන චූදිතව පරීක්ෂා කළේ නම් තමන්ගේ ඇස් ළඟ තිබ්බ තුවාල වෛද්‍යවරයා දකින්නට ඉඩ තිබූ බවත්, මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට 3වන චූදිතව ගෙන ගිය විට 3වන චූදිතව මහේස්ත්‍රාත්වරයා හමුවූ බවටත්, 3වන චූදිත සාක්ෂි ලබාදීමේදී සඳහන් කරන ලදී.

3වන චූදිතට 4 වෙනි මාසයේ 28 වෙනි දින පහර දී, ඔහුගේ දුවගේ ඡායාරූප (photo) පෙන්වා (එනම්, 3වන චූදිතගේ දුවගේ ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයට ගෙනයාමේදී ගන්නා ලද photo) තුන්වන චූදිතගෙන් පාපොච්චාරණය සඳහා අත්සන ගත් බවටත්, එම ඡායාරූප බැලීමට නොහැකි බැවින් තමන්ගේ ඇස් වසා ගන්නා ලද විට පැනෙන් ඇන්න බවටත්, එවිට තමන් අත් දෙකෙන් ඇස් වසා ගත් බවටත්, එම අවස්ථාවේ 3වන චූදිතගේ අත් දෙක ඇද අත් අල්ලා ගන්නා ලද බවටත්, Assistant Superintendent of Police (ASP) විසින් තමාගේ කනට සමාන්තරව වද හිංසා කරණ ලද බවටත්, ඒ අවස්ථාවේ වදහිංසාව දරා ගැනීමට නොහැකිව පාපොච්චාරණයට අත්සන් කළ බවත් 3වන චූදිත සඳහන් කරන ලදී.

තමන්ව CID යේ සිටියදී මානව හිමිකම් නිලධාරීන් හමුවුණ බවටත්, කලින් විස්තරයම ඔවුන්ටත් පැවසූ බවත්, ඔවුන් එය සටහන් කරගත්තේද නැතිද යන්න තමන්නොදන්නා බවත්, එලෙස පැමිණියේ කාන්තා නිලධාරිනියක් බවටත්, එම නිලධාරිනිය දමිළ භාෂාව නොදන්නා බවටත්, තමන් දන්න පොඩි සිංහල භාෂාවෙන් හා අත් භාෂාවෙන් අදාළ විස්තරය එම නිලධාරිනියට පැවසූ බවත් 3වන චූදිත සඳහන් කරන ලදී.

3වන චූදිතට පහරදී ක්ලාන්ත වී කොළඹ මහ රෝහලට ඇතුලත්කරන ලද බව සඳහන් කරන ලදී. 3වන චූදිත තමන්ගේ වම් ඇසට ඉහල පෙන්වමින් මැහුම් පෙන්වා සිටින ලද නමුත් ඒවා පියවි ඇසට නිරීක්ෂණය නොවන බව විනිසුරුතුමන්ලා සටහන් කරන ලදී.

3වන චූදිතගේ හිස පරික්ෂාකර විකිරණවේදීන් ලවා X-Ray ආදිය ලබාගෙන ඇති බවටත් සාක්ෂි ලබා දෙන ලදී. මෙහිදී එලෙස ලබා ගන්නා ලද X-Ray ආදිය ලකුණු කිරීමට 3වන චූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා උත්සහ කිරීමේදී, රජය වෙනුවෙන් පෙනී සිටින ලද ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ උදාර කරුණාතිලක මහතා එම ලේඛන සාක්ෂි ලෙස ලැයිස්තුගත කර නොමැති (list  කර නැත) බව දක්වමින් එම ලේඛන ලකුණු කිරීමට විරුද්ධ විය. එහිදී පැමිණිලි පාර්ශවය සහරාන්ගේ පින්තූරය ලකුණු (mark) කිරීමට උත්සහ කිරීමේදී විත්ති පාර්ශවය එය mark කිරීමට ඉඩ ලබා නොදුන් බවත් රජය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සඳහන් කරන ලදී. මෙම ලේඛන ලකුණු කිරීමට විරුද්ධ වීම සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙමින් 3වන චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා සඳහන් කරන ලද්දේ, ගියවර විත්තියෙන් දිනයක් පැතුවේ මෙම X-Ray ආදිය විමසීමට බව සඳහන් කරන ලදී. Item No 06 ලෙස සාක්ෂි ලැයිස්තුවේ මෙම ලේඛන සඳහන් කර ඇති බවත් 3වන චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා තවදුරටත් සඳහන් කරන ලදී. සාක්ෂිකාර 3වන චූදිත හරහා එම X-Ray ලකුණු කිරීමට යාමේදී එම ලේඛනයන් හී පිටපත් (copy) පැමිණිලි පාර්ශවයට ලබාදී නැති බව රජය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සඳහන් කරන ලදී. එලෙස X-Ray හී copy ලබාදීම ප්‍රායෝගික නැති බව 3වන චූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා එහිදී සඳහන් කරන ලදී. X-Ray ඔප්පු කිරීමට යටත්ව (Subject to proof) ඒ අනුව සාක්ෂි ලෙස සලකුණු කරන ලදී.

බන්ධනාගාරයේ සිටියදී ඇස් පෙනීමේ දුර්වලතා මත 3වන චූදිතට කණ්නාඩි ලබාදී ඇති බව මෙහිදී සඳහන් විය.

X-Ray වාර්තාව පෙන්වීමට අධිකරණයෙන් අවසර දෙන ලදී. ඒ අනුව චූදිත X-Ray හී සඳහන් සිය නම හඳුනා ගන්නා ලද අතර එහි සඳහන් 2020.02.27 යන දිනයද හඳුනා ගන්නා ලදී . ඒ අනුව X-Ray කවරය 3 වි 1 (a)

ලෙස ලකුණු කරන ලදී. කවරය තුල තිබී ගන්නා ලද ලේඛන 5ම පරික්ෂාකර බලා සාක්ෂිකරු ඒවා සාක්ෂිකරුගේ බව හඳුනාගන්නා ලදී. එම ලේඛන CID හිදී සාක්ෂිකරුභාරයේ තිබූ බවත් සාක්ෂිකරු සඳහන් කරන ලදී. 3වි 1 (අ) , 3වි 1 (ආ) , 3වි 1 (ඇ) , 3වි 1 (ඈ) , 3වි 1 (ඉ) ලෙස එම ලේඛන ලකුණු කරන ලදී.

X-Ray වලට අමතරව තවත් වෛද්‍ය වාර්තා සාක්ෂිකරු වෙත ඉදිරිපත්කර ඇති බවත්, ඇස් පෙනීම දුර්වල බැවින් එම වාර්තා පෙර දිනයක හඳුනා ගැනීමට නොහැකි බව සාක්ෂිකරු සඳහන් කළද, මෙදින ඒවා හඳුනා ගැනීමට හැකි තත්වයේ සාක්ෂිකරු සිටින බව සඳහන් විය. 2020.02.07 වන දින 03වන චූදිත වන සාක්ෂිකරු වෙනුවෙන් ඉදිරිපත් කළ වෛද්‍ය වාර්තාව සාක්ෂිකරුට පෙන්වා සිටිමින්, එම රෝග විනිශ්චිත තුණ්ඩුව 3වි 2 ලෙස ලකුණු කරන ලදී.

සාක්ෂිකරුට පහරදී නහයෙන් ලේ ගලනවිට කොළඹ මහ රෝහලට ඉදිරිපත් කළ බවත්, එහිදී පරීක්ෂා කළ බවත් සඳහන් කරන ලදී. 2020.03.10 දින කොළඹ මහ රෝහල නිකුත් කළ ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටි අතර එය සක්ෂිකරු හඳුනා ගන්නා ලදී. එම ලේඛනය 3වි3 ලෙස ලකුණු කරන ලදී.

සාක්ෂිකරුට ඇහි බැම ආශ්‍රිතව පහරදුන් බව සාක්ෂිකරු සඳහන් කළ අතර, ඒ සම්බන්ධයෙන් පරික්ෂා කර අක්ෂි රෝහලෙන් නිකුත් කළ වෛද්‍ය ලේඛන 3වි 4 හා 3 වි5 ලෙස ලකුණු කරන ලදී.

මෙදින සාක්ෂිකරු අධිකරණයේදී හඳුනාගන්නා ලද X-Ray වලට අදාළ x කිරණ පරික්ෂාවට යොමු කළ ලේඛනය 3 වි6 ලෙස ලකුණු කරන ලදී.

අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට සාක්ෂිකරුව යොමු කළ විට 2020.04.27, 2020.04.29 දිනයන්හි වාර්තා නිකුත්කර ඇති බවත්, එම ලේඛන නඩු ගොනුවේ (case record) දැනටමත් තිබෙන බවත් 3වන චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා දන්වා සිටින ලදී. 2020.04.27 M.N. හක් මහතා නිකුත් කළ අධිකරණ වෛද්‍ය වාර්තාව සාක්ෂිකරුට පෙන්වා සිටින ලදී. එම ලේඛනය 3 වි1 ලෙස ලකුණු කර ඇත. 2020.04.29 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව 3 වි7 ලෙස ලකුණු කරන ලදී.

සාක්ෂිකරුට පහරදී පාපොච්චාරණය ගත් බවත්, කාමරයට යන විටත් පරිගණකයේ තමන්ගේ ID No. සටහන් වී තිබෙනවා සාක්ෂිකරු දුටු බවටත්, එම ලේඛනය සිංහලෙන් තිබූ බැවින් හඳුනාගන්න ලද්දේ ID No පමණක් බවටත්, සාක්ෂිකරු ප්‍රකාශයක් කිරීමට පෙරම යතුරුලියනය කර තිබූ බවත්, එය යතුරු ලියනය කරන විට සාක්ෂිකරු නොසිටි බවටත්, CID සිටියදී සාක්ෂිකරුට ඉහළ නිලධාරීන්ට ප්‍රකාශයක් දීමට වුවමනාවක් නොතිබූ බවත් සාක්ෂිකරු මූලික ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් තවදුරටත් සඳහන් කරන ලදී.

සාක්ෂිකරු කැමැත්තෙන් පාපොච්චාරණයක් දුන් බව ASP (සහකාර පොලිස් අධිකාරී) උපුල් සෙනෙවිරත්න මහතා පවසන ලද්ද තමන් පිළිනොගන්නා බවටත්, එලෙස තමන්ගේ කැමැත්තෙන් පාපොච්චාරණයක් නොදුන් බවත් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

විත්තියෙන් හරස් ප්‍රශ්න නැති බව අනෙකුත් විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතුන් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව පැමිණිල්ලෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී.

2020.02.27 පහරදුන් විට, ඇහි බම අසල සහ කකුලේ තුවාලයක් වී ඇති බවත්, එහිදී කොළඹ මහ රෝහල්ට ඇතුලත් කර ඇති බවටත්, ඒ අවස්ථාවේ තමන් සිහිය නොමැතිව සිටි බවටත්, සිහිය නැවත පැමිණීමෙන් අනතුරුව සිදු වූ දේ පිළිබඳ දැන ගත් බවටත්, එහිදී පරික්ෂා කිරීමට පැමිණි දොස්තර විස්තර විමසීමේදී එම ස්ථානයේ තමන් සමඟින්ම CID නිලධාරීන් දෙන්නෙක් සිටිය බැවින් ඒ අවස්ථාවේ ඇත්ත පැවසීමට නොහැකි වූ බවත්, CID නිලධාරීන් දෙදෙනා තමන් වැසිකිලියේ ලිස්සා වැටුන ලෙස පවසන්න තමන්ට කියා තිබූ බවත්, සාක්ෂිකරු ඒ අවස්ථාවේ බයෙන් සිටි නිසා බොරු කිවූ බවත් සාක්ෂිකරු හරස් ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් සඳහන් කරන ලදී. එම රෝග විනිශ්චය වාර්තාව වූ 3වි2 ලේඛනය සාක්ෂිකරුට පෙන්වන ලදී. එහිදී සාක්ෂිකරුට ඉංග්‍රිසි කියවීමට නොහැකි බව සාක්ෂිකරු පවසන ලදී. සාක්ෂිකරු එහි තමන්ගේ නම හඳුනා ගන්නා ලදී. 3වි2 ලේඛනයේ 2 වන පිටුවේ ඉහලින් Accident fall ලෙස තුවාල වීමේ හේතුව ලෙස දක්වා ඇති බව සඳහන් විය. මේ එක බොරු කියූ අවස්ථාවක් කිව්වොත් හරිද යනුවෙන් එම ලේඛනය පෙන්වා පැමිණිල්ලේ නීතිඥ මහතා අසනවිට සාක්ෂිකරු ඔව් යනුවෙන් පිළිතුරු දෙන ලදී.

පහරදීම නිසා ඇස් වලට සිදුවූ හානි සම්බන්ධව කළ ප්‍රතිකාර පෙන්වීමට 3 වි4, 3 වි5 ඉදිරිපත් කරන බව සඳහන් විය. ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරු බොරු කියන්නේ බව නීතිඥ මහතා යෝජනා කරයි.

2020.02.27 පහර දුන්න දින CT Scan ගත් බවත් 3 වි4, 3 වි5 ගන්නා ලද්දේ ඊට පසු දිනක බවත් සඳහන් කරන ලදී.

ඇස් පෙනීම දුර්වල වූයේ පහරදීම නිසා යනුවෙන් සඳහන් කිරීම බොරුවක් බවට රජයේ නීතිඥ මහතා සාක්ෂිකරුට යෝජනා කරන ලදී.

මෙහිදී 3 වන චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා, සාක්ෂිකරු සාක්ෂි මෙහෙයවීමේදී ගත්ත ස්ථාවරය වුයේ ඇස් පෙනීම පරික්ෂ කළ බවයි, ඒ නිසා පහරදීම නිසා ඇස් පෙනීම අඩුවුනා යනුවෙන් මතයකට පැමිණ ප්‍රශ්න අහන්න බැහැ යනුවෙන් සඳහන් කරන ලදී.

එහිදී රජයේ නීතිඥ මහතා, සාක්ෂිකරුගේ ස්ථාවරය වූයේ, 2020.02.27 පහරදීමෙන් කොළඹ ජාතික රෝහලට ගෙන ගිය බවත්, එහිදී ඇස් වලට තුවාල වෙලා ප්‍රතිකාර කල බවත්, එයට 3 වි 4 , 3 වි5 ලේඛන ලකුණු කළ බවත් බව සඳහන් කරන ලදී. ඒ අනුව ඇස් වලට පහර දීම සඳහා පැමිණිල්ලේ ස්ථාවරය අනුව ප්‍රශ්න ඇසීමට ඉඩ ලබා දෙන ලදී.

පහරදීමේ ප්‍රතිඵලයක් ලෙස ඇස් පෙනීම දුර්වල වූවා යන්න බොරුවක් බවට රජයේ නීතිඥ මහතා සාක්ෂිකරුට යෝජනා කරන ලදී. තමන්ව රෝහලට ගෙනිච්ච බවටත්, පෙනීම් ගැන පරික්ෂා කළ බවටත්, තමන් බොරු නොකී බවටත් සාක්ෂිකරු සඳහන් කරන ලදී. ඇස් පෙනීමේ දුර්වලතාව වයස සමඟ පැමිණි දුර්වලතාවයක් බව සාක්ෂිකරුට රජයේ නීතිඥ මහතා යෝජනා කරයි. එයට පිළිතුරු දෙමින්, වෙන්න පුළුවන් යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

ලේඛනයක් ගැන සඳහන් කරමින් එම ලේඛනය 2020.03.27 පහරදීමට ඇසට ප්‍රතිකාර ගැනීම තහවුරු කරන ලේඛනයක්ය යන්න බොරුවක් බව රජයේ නීතිඥ මහතා යෝජනා කරයි. එයට පිළිතුරු දෙමින්, සාක්ෂිකරු මේ  සම්බන්ධයෙන් වෛද්‍යවරයාට මුකුත් කිව්වේ නැති බවටත්, වෛද්‍යවරයා විසින් පරික්ෂා කළ බවටත් සඳහන් කරන ලදී.

පහරදීමයි මේ ලේඛනයි සම්බන්ධයක් නැහැ යනුවෙන් රජයේ නීතිඥ මහතා යෝජනා කරයි. දන්නේ නැහැ යනුවෙන් සාක්ෂිකරු ඒ සඳහා පිළිතුරු දෙන ලදී.

නීතිඥ මහතා මෙය ලකුණු කළේ ඇසට පහරදීම සම්බන්ධව යන්න සාක්ෂිකරු පිළිගන්නා ලදී. එම ලේඛනය (3වි5) 2023.02.27 පහරදීමට අදාළ ලේඛනයක් යන්න බොරුවක් නේද යන්න විමසීමේදී සාක්ෂිකරු බොරුවක් නොවේ යනුවෙන් සඳහන් කරන ලදී. එම ලේඛනයයි පහරදීමයි අතර සම්බන්ධයක් නැහැනේ යනුවෙන් විමසීමේදී, මම ඇස් වල අපහසුතාවයක් තියෙනවා කිව්වම එයාලා එක්ක යනවා යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

3 වි 5 ලේඛනයයි පහරදීමයි අතර මාස 7 කට වඩා පරතරයක් තියෙනවා යන්න පිළිගන්නවද යන්න විමසීමේදී වෙන්න පුළුවන් යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී. ලේඛනයයි පහරදීමත් අතර සම්බන්ධයක් නැහැ යනුවෙන් විමසීමේදී, එය තමන්ට කිව නොහැකි බවටත්, එය කිව යුත්තේ වෛද්‍යවරයා බවටත් සඳහන් කරන ලද සාක්ෂිකරු තමන්ට මෙතන බොරු කියන්න ඕන නැහැ යනුවෙන් ද සඳහන් කරන ලදී.

3වි1(අ)  සිට 3 වි1 (ඉ)  X Ray සහ CT Scan  ඉදිරිපත්කර ඇත. එම ලේඛන වල සාක්ෂිකරුට සිදුවූ හානි ගැන නැහැ කියල යෝජනා කළොත් පිළිගන්නවද යනුවෙන් රජයේ නීතිඥ මහතා විමසන ලද අවස්ථාවේ, ඒ ගැන තමන්ට දැනුමක් නොමැති බව සාක්ෂිකරු සඳහන් කරන ලදී . 2023.02.27 CID එකෙන් රෝහල් ගතකර විවිධ පරීක්ෂණ කර ඇති බව සඳහන් කර, සාක්ෂිකරුට හිතා මතා පහර දුන්නේනම් සාක්ෂිකරුව රෝහල්ගත කිරීමට ඔවුන් ඉදිරිපත් නොවන බව රජයේ නීතිඥ මහතා යෝජනා කරන ලදී. කියන්න දන් නැති බවට සාක්ෂිකරු පිළිතුරු ලබා දෙමින් සඳහන් කරන ලදී .CID මහත්වරු සාක්ෂිකරුගේ සෞඛ්‍ය ගැන  ක්‍රියා කලා යන්න රජයේ නීතිඥ මහතා යෝජනා කළ විට සාක්ෂිකරු එය පිළිගන්නා ලදී.

එලෙස ක්‍රියා කරන අයට සාක්ෂිකරුට ගහන්න ඕන නැහැනේ යනුවෙන් පැමිණිල්ලෙන් සඳහන් කළ අවස්ථාවේ, එයාලා තමයි ගැහුවේ, එයාල තමයි එක්කන් ගියේ යනුවෙන් සාක්‍ෂිකරු පිළිතුරු ලබා දෙන ලදී.

මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයාට 3 වන චූදිත ප්‍රකාශයක් ලබාදීම ගැන හරස් ප්‍රශ්න අසන ලදී. එහිදී 2019.06.13 මාවනැල්ල උසාවියට සාක්ෂිකරුව ගෙන ගිය බව සඳහන් කරන ලදී.

JMOට (Judicial Medical Officer) යොමු කර  අධිකරණයට ගෙන ගිය අවස්ථාවේ මහේස්ත්‍රාත්වරයා සමඟ කතා කරන්න සාක්ෂිකරු උත්සහ කලාද යන්න විමසීමේදී ඒ අවස්ථාවේ උත්සහ නොකළ බව සඳහන් කරන ලදී.

මේ අවස්ථාවේ මහේස්ත්‍රාත් ළගට ගෙනියද්දීත් පහරදීමක් කර තිබුනා යන්න සඳහන් කරන ලදී.(එක දිගට පහර දුන් බවටත් සඳහන් කරන ලදී)

2019.06 වන මාසයේ මහේස්ත්‍රාත්ට කතා කරලා පහරදීම ගැන නොකියූ බවත්, සාක්ෂිකරු ඒ අවස්ථාවේ බයෙන් සිටි බවත් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

2020.04.27 ට කලින් ගහල තිබ්බත් ඊට කලින් මහේස්ත්‍රාත්ට කියන්න වුවමනාවක් තිබ්බේ නැහැ. 2020.04.28 ට කලිනුත් අත්සන් අරන් තියෙනව නමුත් වඩාත් හිංසා කළේ එදා යනුවෙන් තවදුරටත් හරස් ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

2020.04.27 ත් ගැහුවද යනුවෙන් සාක්ෂිකරුගෙන් විමසීමේදී, මට කියන්න පුළුවන් ගැහුවා කියාල දිනයක් කියන්න බැහැ යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී. තමන්ව ප්‍රකාශයක් ගන්න යනවා නම් ගහන්නේ නැතුව එක්කන් යන්නේ නැහැ යනුවෙන්ද සාක්ෂිකරු සඳහන් කරන ලදී.

2022.10.15 දින සාක්ෂිකරුව රිමාන්ඩ් කළ බවත් සඳහන් කරන ලදී.

සාක්ෂිකරුට පහර දෙනු ලැබුවේ, කට උත්තරයක් ගනු ලැබූ දිනයන් හී දීද, නැති නම් කට උත්තරයක් ගන්නේ නැති දිනටද යනුවෙන් විමසන ලද අතර, ප්‍රකාශ ගන්න කියල ගෙනියද්දි ප්‍රකාශයක් ගත්තත් නැතත් ගහල තමයි එවන්නේ යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

28 සාක්ෂිකරුට පහර දෙන ලද්දේ සාමාන්‍ය කාර්යාලයක බවටත්, එහිදී තමන්ගෙන් හිජාස් හිස්බුල්ලාව දන්නේද යන්න විමසූ බවටත්, අල්ලපු cell එකේ ඔහු සිටි බැවින් දන්නවා යනුවෙන් පැවසූ බවත්, එළියේදී ඔහුව දන්නවාද යන්න විමසූ විට, තමන් දන්නේ නැහැ යනුවෙන් පැවසූ බවත්, වෙන අයගෙ පින්තූර පෙන්වා දන්නවාද යන්න විමසූ බවත්, හරස් ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් සාක්ෂිකරු සඳහන් කරන ලදී.

තමන්ගේ ඇස ළගට අතින් ගහගෙන ගහගෙන ගියා යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී. 2020.04.28 ගහද්දි තුවාල වුනේ නැහැ යනුවෙන්ද සාක්ෂිකරු සඳහන් කරන ලදී.

2020.04.27 කාර්යාලයේදී අතින් තමන්ගේ පිටට ගැසූ බවත්, පැය ගණනක් ඉන්නව ගහල ගහල යනවා, ඒ හැම අවස්ථාවේම එක්කෙනෙක් දෙන්නෙක් ඇවිල්ල පහරක් ගහනවා, කාර්යාලයට එන හැමෝම ගහල යනවා. 27 වෙනිදා කී දෙනෙක් ගැහුවද යන්න විමසීමේදී මතක නැහැ යනුවෙන් සාක්ෂිකරු සඳහන් කරන ලදී. මාධව සහ තිසේර යන මහත්වරුන් ගැසූ බව කිව්වා නේද යනුවෙන් විමසන ලද අවස්ථාවේ, ඒ මුල් අවස්ථාවේදී බව සාක්ෂිකරු සඳහන් කරන ලදී. නිකන් හරි තට්ටුවක් දාගෙන යනවා. ඉස්සරහට තියල අත් වලට මාංචු දාල තියෙද්දී ගහන්නේ. ගහනවා නමුත් තුවාල ඇතිවෙන පරිදි ගහන්නේ නැහැ. මේ ආකාරයෙන් සාක්ෂිකරු පහරදීම් සම්බන්ධයෙන් විවිධ ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදෙන ලදී.

27 උදේ ගැසූ බව වෛද්‍යවරයාට නොකියූ බවට යෝජනා කරනවා යනුවෙන් රජයේ නීතිඥ මහතා සඳහන් කළ අවස්ථාවේ, ලිව්වද නැද්ද දන්නැහැ නමුත් තමුන් කියූ බවත්, දොස්තරට තමුන් කියන ලද දෑ තේරුණාද දන්නේ නැති බවටත්, සාක්ෂිකරු සඳහන් කරන ලදී.

වම් ඇස උඩ තුවාල වුනේ බීම වැටිලා කියල තියනවා යනුවෙන් රජයේ නීතිඥ මහතා සඳහන් කිරීමේදී, තමුන් 27 හා 29 JMO දෙන්නෙක් ළගට ගිය බවත්, තමුන් කොයි එකේද එය කිව්වේ කියල මතක නැති නමුත් සාක්ෂිකරු එය පැවසු බව සඳහන් කරන ලදී. ඒ අනුව JMO වරුන් වෙත පවසන ලද දේ සහ එහිදී වෛද්‍යවරුන් සටහන් කර ඇති දෑ පිළිබඳ තවදුරටත් හරස් ප්‍රශ්න විමසන ලදී.

සාක්‍ෂිකරු CIDයේ සිටියදී බලන්න පැමිණි, ඥාතින්ට, රතු කුරුස සංවිධානයේ නිලධාරීන්ට, මානව හිමිකම් කොමිසමේ (HRC) නිලධාරීන්ට කිසිම අවස්ථාවක තමන්ට පහර දුන් බවට සාක්‍ෂිකරු පවසා නැති බව රජයේ නීතිඥ මහතා යෝජන කරන ලදී.

මාවනැල්ල අධිකරණයේ හා HRC එකේ සාක්ෂිකරුට කරන ලද පහරදීම් පිළිබඳ පැමිණිල්ලක් දමා ඇති බවත්, CID එකේ සිටියදී HRC එකට කියූ බවත්, සාක්ෂිකරු සඳහන් කරන ලදී. සාක්ෂිකරු HRC පැමිණිල්ලේ කුවිතාන්සිය ඉදිරිපත් කර නැති බව සඳහන් කරන ලද රජයේ නීතිඥ මහතා, නමුත් මෙදින සාක්ෂිකරු වෛද්‍ය වාර්තා පරිස්සම් කර අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර, HRC එකට සාක්ෂිකරු පහරදීම ගැන පැමිණිලි කර නැති බවට යෝජනා කරයි.

ICRC (රතුකුරුස සංවිධනයට) ට සාක්ෂිකරු පැමිණිලිකර නැති බවද රජයේ නීතිඥ මහතා යෝජනා කරන ලදී.

මෙදින සවස් වනතුරු සාක්ෂි විමසීම පවත්වන ලද නමුත් ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතා වෙත ඒ පිළිබඳ දන්වා මා විසින් පැමිණෙන ලදී. මා අධිකරණයේ රැඳී සිටි අවස්ථාවේදී අධිකරණයේ සිදු වූ සාක්ෂි විමසීම් ඇසුරෙන් ඉහත සටහන සකස් කර ඇත.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 සැප්තැම්බර් මස 05 වන දින

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**